කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOM E3073 - කළමනාකරණ තොරතුරු පද්ධති**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. පද්ධතියක් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ?

(ලකුණු 02)

ආ. තොරතුරු පද්ධතියක ප්‍රධාන උපාංග හඳුනා ගැනීම සඳහා දළ රූප සටහනක් අඳින්න. එක් එක් උපාංගය සඳහා උදාහරණය බැගින් දෙන්න.

(ලකුණු 06)

ඉ. පහත පද කෙටියෙන් විස්තර කරන්න.

i. දත්ත
ii. තොරතුරු
iii. තොරතුරු පද්ධති
iv. තොරතුරු තාක්ෂණය

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

02. අ. සංවිධානයක් තුල මෙහෙයුම් කළමනාකරණ මට්ටම සඳහා ප්‍රධාන වශයෙන් සේවය සපයන්නේ කුමන තොරතුරු පද්ධතියද ?

(ලකුණු 02)

ආ. සංවිධානයක් සඳහා දැනුම් සේවකයන්ගේ වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු 05)

ඇ. සංවිධානයක් තුල මධ්‍ය කළමනාකරණය සඳහා තීරණ උපකාරක පද්ධති මගින් කුමන ආකාරයේ සේවාවක් සපයනු ලබයි ද ?

(ලකුණු 05)

ඉ. ශ්‍රිතිය දෘෂ්ටිකෝණය අනුව ඔබ තොරතුරු පද්ධති වර්ග කරන්නේ කෙසේද ? එක් එක් වර්ගය උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. අ. ඉහළ පෙළ කළමනාකරුවන් විසින් ප්‍රධාන වශයෙන් භාවිතා කරන තොරතුරු පද්ධතියක් දක්වන්න.

(ලකුණු 02)

ආ. මානව සම්පත් තොරතුරු පද්ධතිය භාවිතා කරමින් කළමනාකරුවෙකුට ඉටු කළ හැකි ප්‍රධාන කාර්යයන් මොනවාද ?

(ලකුණු 04)

ඇ. සංවිධානයක් තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා විවිධ තොරතුරු පද්ධති විවිධ ආකාරයෙන් සේවය සලසයි. සංවිධානයක කළමනාකරණ මට්ටම් සහ තොරතුරු පද්ධති අතර සම්බන්ධතාවය කුමක්ද ?

(ලකුණු 06)

ඉ. " ආයතනයක් සඳහා අගයන් නිර්මාණය කිරීමේදී තොරතුරු පද්ධති ප්‍රධාන උපාංගයකි." විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04. අ. විද්‍යුත් ආයතනයක් ( digital firm) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ?

(ලකුණු 03)

ආ. විද්‍යුත් ආයතනයන්ගේ ඉස්මතු වීම පැතලි සංවිධානයන් සඳහා මඟ පෙන්වයි. ඔබ මෙම ප්‍රකාශනය සමඟ එකඟ වන්නේද ? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 05)

ඇ. විද්‍යුත් වෙළෙඳපොලක් යනු කුමක්ද ? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඉ. ව්‍යාපාර ලෝකය තුල තොරතුරු පද්ධති වල වැදගත්කම සඳහා ගෝලීය ආර්ථිකයේ ඉස්මතු වීම බලපාන්නේ කෙසේද ?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

05. අ. ඔබට විද්‍යුත් වාණිජ්‍යයෙහි අත්දැකීම් අත් කරගත හැකි වෙබ් අඩවි දෙකක් හඳුනාගන්න.

(ලකුණු 02)

ආ. නූතන ව්‍යාපාර ලෝකයෙහි අන්තර්ජාලය තුල ඔබට කළහැකි දේ මොනවාද ?

(ලකුණු 05)

ඇ. ඔබ විද්‍යුත් වාණිජ්‍යය සහ විද්‍යුත් ව්‍යාපාර වෙන්කොට දක්වන්නේ කෙසේද ?

(ලකුණු 05)

ඉ. වර්තමාන ව්‍යාපාරයයන් සඳහා තොරතුරු පද්ධතිවල වැදගත්කම සාරාංශ කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06. අ. සයිබර් අපරාධ සඳහා උපකරණයක් ලෙස පරිගණකයක් භාවිතා කළ හැක්කේ කෙසේද ?

(ලකුණු 05)

ආ. නූතන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ, සාමාජීය සහ ආචාරධර්ම ගැටළු පුවත් නිර්මාණය කරන මාතෘකාවන් වේ.

තොරතුරු තාක්ෂණ පරිසරය තුල සමාජීය ගැටළු සහ ආචාරධර්ම ගැටළුවෙන්කොට දක්වන්න.

(ලකුණු 06)

ඇ. විද්‍යුත් ලෝකය තුල පරිගණක අපතය සමාජීය ගැටළුවක් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ඉ. පහත පද කෙටියෙන් විස්තර කරන්න.

i. Hacking (සැසීම)

ii. Cracking

iii. පරිගණක වෛරස්

(ලකුණු 06)

(මුළු ලකුණු 20)